**නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - (අදියර 01) - 2024**

---

නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ (අදියර 01) 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය අතර 2016 ජුනි 01 දින එළඹි අංක සීඑල්කේ 1013 – 01 කේ දරන ණය පහසුකම් ගිවිසුමේ 3.4.3 (එච්) වගන්තිය සහ 2016 මාර්තු 16 දින එළඹි අංක සීඑල්කේ 1013-02 එල් දරන මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය පහසුකම් හා මූල්‍ය ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.
ව්‍යාපෘතියේ අරමුණු වන්නේ මීගමුව මහ නගර සහා බල ප්‍රදේශයේ 73,000 ක ජනතාවක් සඳහා අපජල එකතු කිරීමේ සහ පිරිපහදු කිරීමේ පද්ධති පුළුල් කිරීම සහ සනීපාරක්ෂක සේවා සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම, ජල හා සනීපාරක්ෂ අංශයේ ව්‍යුහය පැහැදිලි කිරීම සහ වැඩි දියුණු කිරීම, දරිද්‍රතාව පිටු දැකීම, උපාය මාර්ග සහ වෙරළාශ්‍රිත හා නාවික පරිසර පද්ධති සංරක්ෂණය කිරීම සහ ජෛව විවිධත්වය පවත්වා ගැනීම සඳහා නිර්මාණය කර ඇති දුප්පතුන්ට හිතකර ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම තුළින් වරප්‍රසාද නොලත් නිවැසියන්ට සේවා ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථා පහසු කිරීම වේ.
ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,739.81 කට සමාන යූරෝ මිලියන 107.70 ක් වන අතර ඉන් රු.මිලියන 13,224 කට සමාන යූරෝ මිලියන 76 ක් ණයක් වශයෙන් සහ රු.මිලියන 991.81 කට සමාන යූරෝ මිලියන 5.70 ක් ප්‍රදානයක් ලෙස මූල්‍යයනය කිරීමට ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය එකඟ වී තිබුණි. ඉතිරි යූරෝ මිලියන 26 ක ප්‍රමාණයට සමාන රු.මිලියන 4,524 ක් ශ්‍රී ලංකා රජය විසින් දායක විය යුතුය. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජුනි 01 දින ආරම්භ කරන ලද අතර 2022 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. තවද ණය දෙන ආයතනය මුදල් ලබා දීම නතර කිරීම හේතුවෙන් 2023 අප්‍රේල් 30 වන විට ව්‍යාපෘතිය තාවකාලිකව නතර කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|
| රුපියල් මිලියන 465 ක බැඳීම් ගාස්තු, රුපියල් මිලියන 61 ක තක්සේරු ගාස්තු සහ රුපියල් මිලියන 16 ක ණය පොලිය ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 දෙසැම්බර් 31 වන විට ණය ශේෂය සහ කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය රුපියල් මිලියන 542 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉහත ව්‍යාපෘතිය ප්‍රදාන අරමුදල් සහිත ව්‍යාපෘතියකි. එම ව්‍යාපෘතියට අදාළ බැඳීම් ගාස්තු සහ ණය පොලිය මුදල් අමාත්‍යාංශය විසින් දරනු ලැබේ. | මෙම ගිණුම්කරණ දෝෂය නිවැරදි කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

ප්‍රධාන සංරචක තුනකින් සමන්විත 2016 ජුනි මාසයේදී ආරම්භ වූ මෙම ව්‍යාපෘතිය 2022 ජුනි මාසයේදී නිම කිරීමට අපේක්ෂිතව තිබුණි. 2022 ඔක්තෝබර් 28 දිනැති මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු නිර්දේශය මත පදනම්ව 2023 අප්‍රේල් 30 වන දින ව්‍යාපෘතිය තාවකාලිකව වසා දැමූ අතර මීගමුව, ගාල්ල සහ උණවටුන ප්‍රදේශ සඳහා මූලික සැලසුම් මෙන්ම මීගමුව සඳහා සවිස්තරාත්මක සැලසුම් සහ ලංසු ලේඛන සකස් කිරීමද, ගාල්ල සඳහා සවිස්තරාත්මක සැලසුම් කෙටුම්පත් කිරීම සහ ලංසු ලේඛන කෙටුම්පත් කිරීම සහ ක්ෂේත්‍ර තුන සඳහාම ශක්‍යතා අධ්‍යයනයන් සිදුකිරීම ද අවසන් කර ඇත.

| ව්‍යාපෘති සංරචකය | 2024 දෙසැම්බර් 31 වන විට | | විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | අපේක්ෂිත භෞතික කාර්ය සාධනය ප්‍රතිශතය | ළඟා කරගත් කාර්ය සාධනය ප්‍රතිශතය | | | |
| මීගමුව නගරය සඳහා මලාපවහන යටිතල පහසුකම් අධ්‍යයනය කිරීම සහ ඉදිකිරීම, ගාල්ල/උනවටුන සහ කැලණිය/පෑලියගොඩ ප්‍රදේශ සඳහා මලාපවහන යටිතල පහසුකම් අධ්‍යයනය කිරීම සහ ලංසු ලේඛන පිළියෙල කිරීම හා මලාපවහන අංශයේ තාක්ෂණික සහාය සහ ධාරිතා වර්ධනය. | 100 | 12 | වැඩ කොන්ත්‍රාත්තු ප්‍රදානය කර නොතිබූ අතර, අවලංගු කරන අවස්ථාව වන විට යෝජිත ණය මුදලින් ආසන්න වශයෙන් සියයට 94 ක් ප්‍රයෝජනයට නොගෙන පැවතුනි. 2024 දෙසැම්බර් 31 වන විට, ව්‍යාපෘතිය වසර හතකට වැඩි කාලයක් අඛණ්ඩව පැවතුනද, සමස්ත භෞතික ප්‍රගතිය සියයට 12.31 ක් පමණක් විය. | විවිධ හේතූන් මත ව්‍යාපෘති කටයුතු ප්‍රමාද වී තිබූ අතර ණය මුදල ඌන උපයෝජනයට ගෙන තිබුණි. | ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට පියවර ගත යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| 2024 දෙසැම්බර් 31 වන විට, මෙම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජයෙන් රුපියල් මිලියන 221 ක් සහ ණය දෙන ආයතනයෙන් රුපියල් මිලියන 1,448 ක් ඇතුළත්ව රුපියල් මිලියන 1,669 ක් වැය වී තිබුණි. එයින් රුපියල් මිලියන 1,425 ක් උපදේශන කොන්ත්‍රාත්තුවක් යටතේ වියදම් කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මීගමුව අපජල පවිත්‍රාගාරය සඳහා සවිස්තරාත්මක සැලසුම් සහ ලංසු ලේඛන සකස් කිරීම සහ ගාල්ල, උණවටුන සහ කැලණිය අපජල පද්ධති සඳහා ශක්‍යතා අධ්‍යයන සහ මූලික සැලසුම් සකස් කිරීම පමණක් සිදුවී තිබුණි. කෙසේ වෙතත්, සියලුම ප්‍රධාන ඉදිකිරීම් කටයුතු කිසිදු භෞතික හෝ මූල්‍ය ප්‍රගතියකින් තොරව ප්‍රසම්පාදන අදියරේ පැවතුනි. | භෞතික කටයුතු අවසන් කර නොතිබුණද, මීගමුව අපජල ව්‍යාපෘතිය සඳහා සැලසුම් සහ ටෙන්ඩර් අවසන් කර තිබුණි. | අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘති කටයුතු නියමිත කාලය තුළ අවසන් කළ යුතුය. |

## 3.3 ව්‍යාපෘතියේ අරමුණු හා සම්බන්ධ නොවන ක්‍රියාකාරකම්

| | විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2023 නොවැම්බර් 07 දිනැති අංක 23/1879/611/027 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන් වූ පසු සහ නිශ්චිත මූල්‍යකරණ ක්‍රමයක් හඳුනා ගැනීමෙන් පසු ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් දෙන ලදී. කෙසේ වෙතත්, මෙම නියෝගය තිබියදීත්, ව්‍යාපෘතිය නිල වශයෙන් අත්හිටුවා තිබේද නැතහොත් අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබේද යන්න පිළිබඳව ලේකම්වරයා විසින් කිසිදු ස්ථිර තහවුරු කිරීමක් ලබා දී නොතිබුණි. | ආයතනික ණය ගිණුම්වල ඉතිරි මුදල් 2024 දෙසැම්බර් 31 හා 2025 මාර්තු 24 දින විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණද, අදාල අරමුදල් තවමත් එම ණය ආයතනයට බැරකර නොමැති බැවින්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව (ERD) මගින් ගිණුම් අවසන් කිරීමේ නිවේදනය නිකුත් කිරීම ප්‍රමාද කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුගමනය කළ යුතුයි. |
| (ආ) | 2024 දෙසැම්බර් 31 වන දින වන විට, අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමකින් තොරව ව්‍යාපෘතිය නතර කරන ලදී, ශ්‍රී ලංකා රජයට මූලික පිරිවැය ලෙස රුපියල් මිලියන 1,890 ක් දැරීමට සිදුවූ අතර සමස්ත ආයෝජනයම ගිලුණු පිරිවැයක් බවට පත්වීමේ අවදානමට ලක්වී තිබුණි. අත්‍යවශ්‍ය අපජල යටිතල පහසුකම් හරහා සංචාරක ව්‍යාපාරයේ තිරසාර සංවර්ධනයට සහාය වීම අරමුණු කරන ලද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම නිසා ඍජු මූල්‍ය අලාභයක් සිදු වූවා පමණක් නොව, මීගමුව, ගාල්ල, උණවටුන සහ කැලණිය යන ප්‍රදේශවල සංචාරක ක්‍රියාකාරකම්වල වර්ධනය හා ශක්‍යතාව අනතුරේ හෙළමින් රටට කෙටිකාලීන හා දිගු කාලීන ආර්ථික ප්‍රතිලාභ අහිමි කර තිබුණි. | ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය හේතුවෙන් රජය විසින් ගත් තීරණය මත, ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි විය. | ව්‍යාපෘති පිරිවැය අහිමි වීමෙන් පවතින අවදානම අවම කිරීමට පියවර ගත යුතුය. |

## 3.4 ඌණ උපයෝජිත වත්කම්

| | විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | වසර 6ක කාලයක් අවසන්වී 2022 ජූනි 30 වන දිනට ව්‍යාපෘතිය අවසන් විය යුතු වූවත්, 2024 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 12.31ක් පමණක් ළඟා කරගෙන තිබුණි. ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය විසින් ණය ලෙස යුරෝ මිලියන 76ක් සහ ප්‍රදාන ලෙස යුරෝ මිලියන 5.7ක් ලබාදීමට බැඳී සිටියද, කෙසේ වෙතත්, ණය මූලායෙන් යුරෝ මිලියන 4.74ක් (සියයට 6ක්) සහ ආධාරයෙන් යුරෝ මිලියන 2.14ක් (සියයට 38ක්) පමණක් උපයෝජනය වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඉතිරි ප්‍රදාන සහ ණය මුදල අවලංගු කර තිබුණි. | මහජන විරෝධතා හේතුවෙන් ඉඩම් අත්පත් කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීම නිසා මලාපවහන ව්‍යාපෘතිය සඳහා ඉඩම් තෝරා ගැනීමට බාධා ඇති වූ අතර, ඉඩම් පිහිටීම පොම්පාගාර සහ අපජල පද්ධති සැලසුම් කිරීමට සෘජුවම බලපාන බැවින්, අදාළ කටයුතු නියමිත වේලාවට නිම කළ නොහැකි විය. | ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |
| (ආ) | අරමුදල් මන්දගාමීව භාවිතා කිරීම හේතුවෙන් සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ රටට කිසිදු ආර්ථික ප්‍රතිලාභයක් නොමැතිව රජයට රුපියල් මිලියන 465 ක බැඳීම් ගාස්තු දැරීමට සිදුවී තිබුණි. | ඉහත සඳහන් කළ විවිධ හේතුන් නිසා, එකඟ වූ ණය කාලය තුළ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට නොහැකි විය. | ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |